# පිරිත් දේශනාව හා බැඳි
# චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ අධ්‍යයනයක්

**- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උඩුගම්පොල ගුණානන්ද හිමි**

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ආගමික උත්සවයක් වශයෙන් ආරම්භ වූ පිරිත් දේශනාව පිළිබඳව සැලකීමේදී විවිධ උපචාර විධීන්ගෙන් සමන්විත වී ඇති බව පැහැදිලිය. විවිධ පළාත්බදව මෙම උපචාර විධීන්හි වෙනස්කම් දක්නට ලැබේ. දේශනා ශෛලිය, පිරිත් මණ්ඩපය සැකසීම, ශබ්ද පූජා පැවැත්වීම, දේශනා ශෛලිය ආදී වශයෙන් එම වෙනස්කම් දක්නට ලැබේ. මෙම ලිපියේදී විශේෂ වශයෙන් පිරිත් දේශනාව හා බැඳුණු විවිධ පළාත්බද චාරිත්‍ර විධි පිළිබඳව අධ්‍යයනයක් කිරීම අපේක්ෂිතය.

සිංහල බෞද්ධයා එදිනෙදා ජීවිතයේ සෑම කුදු මහත් කටයුත්තකදීම ආගමික සිරිත් විරිත් අනුගමනය කිරීමට පුරුදු වී සිටියි. මෙම සද්කාර්යය සඳහා ඉතා ප්‍රබල ලෙස සිංහල බෞද්ධයාගේ ජීවිතයට බලපෑ ආගමික චාරිත්‍රය වන්නේ පරිත්‍රාණ දේශනාවයි. පිරිතත් සිංහල බෞද්ධයාත් අතර ඇති මෙම අවියෝජනීය සම්බන්ධතාවය ඈත අතීතයේ පටන්ම පැවැති බවට සෑම කලා අංශයකින් මෙන්ම ඓතිහාසික තොරතුරු ආශ්‍රයෙන් ද තහවුරු වේ. දරුවකු මව්කුස පිළිසිඳ ගත් දා පටන් අංගුලිමාල පිරිතෙන් ආරක්ෂාව ලබා ගන්නා සිංහල බෞද්ධයා මරණ මංචකයේදීත් පිරිත් දේශනා කරවා ගැනීමට



උනන්දු වන්නේ පිරිත් නැමැති මෙම සත් ක්‍රියාවෙහි ඇති ප්‍රබලත්වය අත්දැකීමෙන්ම දන්නා බැවිනි.

## පිරිත යන වචනයේ අර්ථ විවරණය

පරි පූර්ව ත්‍රා ධාතුවෙන් නිපන් සංස්කෘත පරිත්‍රාණ, පාළි පරිත්ත යන පදයන්ගෙන් බිඳී එන සිංහල පිරිත් යන පදයේ අර්ථය ආරක්‍ෂාව යන්නයි. මිනිසාගේ සිතුම් පැතුම්වලට බාධා කරවන නොයෙක් මාදිලියේ අදෘෂ්‍යමාන අපල උපද්‍රවයන්ගෙන් ආරක්ෂාව සැලසීම පිරිතේ ප්‍රධානම කර්තව්‍යයයි. බෞද්ධ ශාන්ති කර්මය පරිත්‍රාණ දේශනාවයි. බෞද්ධයාගේ ආරක්‍ෂන ක්‍රමය පිරිතයි. පරිත්ත යන වචනය අටුවාචාරීහු මෙසේ විග්‍රහ කරති. **"පරිසමන්තතො තායති රක්ඛතීති පරිත්තං", "අන්තරායං පරිහරන්තං තායතී'ති පරිත්තං", "පරිතොවා සබ්බුපද්දවතො තායතීති පරිත්තං"'** යනුවෙන් හාත්පසින් ආරක්‍ෂා කරයි, අන්තරාය දුරු කරමින් ආරක්‍ෂා කරයි, සියලුම උපද්‍රවලින් ආරක්‍ෂා කරයි. යන අර්ථ පිරිත යන වචනයේ ඇත.

බුදුසමයේ විශිෂ්ට බුද්ධිමය සදාචාරාත්මක රාමුව තුළ පූජා චාරිත්‍ර හෝ එබඳු ආගමික උත්සව සඳහා ඉඩක් නොමැති වුව ද සාමාන්‍ය පොදු මිනිසාගේ ජීවිතයක් සමඟ බැඳී පවතින ජීවන ගැටලුවලින් සහනයක් ලබා ගැනීමට ඔවුන් පූජා චාරිත්‍ර වෙත යොමුවීමේ මානසික ස්වභාවය බුදු සමයට සපුරා අමතක කළ නොහැකිය. නිර්වාණගාමී ප්‍රතිපදාවේදී පූජා චාරිත්‍ර, ශාන්ති කාර්ම වැනි දේ "තිරච්ඡාණ විද්‍යා" නමින් හඳුන්වා ඉවත් කළත් බෞද්ධ ජනතාව ඒ තුළින් ඉවත් කළ නොහැක. මූලික බෞද්ධ ඉගැන්වීම්වලට පටහැනි නොවන ආකාරයෙන් මිනිස් මානසික අවශ්‍යතාවය ඉටුකරලීමට ක්‍රමයක් ආදේශ කළ යුතු විය. ඒ සඳහා උපයෝගී කර ගත හැකි සාර්ථකම ආගමික චාරිත්‍රය වූයේ පිරිත් දේශනාව නම් වූ ශාන්තිකර්ම විධියයි.

## පිරිත වර්ගීකරනය

පිරිත් දේශනාව සඳහා ගතවන කාලය අනුව පිරිත් වර්ගකළ හැකි. ඒ අනුව,

- වරු පිරිත
- තුන්වරු පිරිත
- තිස්පැයේ පිරිත
- තිස්පැය තුනේ පිරිත
- තිස්පැය පහේ පිරිත
- තිස්පැය හතේ පිරිත
- සති පිරිත ආදී වශයෙන් විවිධ ආකාරයෙන් පවත්වන බව පැහැදිළිය. මීට අමතරව සෙත් පිරිත හා වත පිරිත වශයෙන් ද භාවිත කරනු දක්නට ලැබේ.[2]

ශ්‍රී ලාංකික බෞද්ධ සමාජය තුළ භාවිත පිරිත් දේශනාවන්හි අන්තර්ගත විවිධ චාරිත්‍ර දක්නට ලැබේ. ඉහතින් දැක්වූ දේශනාවන්හි එම චාරිත්‍ර දක්නට ලැබේ. ඒවා මෙසේ දැක්වීමට පුළුවනි.

## පිරිත සඳහා ආරාධනා කිරීමේ සිරිත

පිරිත් දේශනාව සඳහා ආරාධනා කිරීම කීප අවස්ථාවකම සිදුකරනු ලබයි. මූලික වශයෙන් නිවසක් වේවා, ආයතනයක් වේවා, පොදු ස්ථානයක් වේවා වරු පිරිතක් හෝ තිස්පැයේ පිරිතක් හෝ සිදු කරන්නේ ද මූලිකව අදාළ විහාරස්ථානයට ගොස් භික්ෂූන් වහන්සේට දැහැත් වට්ටියක් පිළිගන්වා පිරිත සඳහා ආරාධනා කොට සුදුසු දිනයක් වෙන්කර ගැනීම සිරිතක් වේ. පිරිත් දේශනාව සඳහා මහා සංඝරත්නය වැඩමකළ පසු දැහැත් වට්ටියක් පිළිගන්වා "මෙලොව ආරක්ෂාව පිණිසත්, පරලොව පිං පිණිසත් මෙතැන් පටන් අප කෙරෙහි අනුකම්පාවෙන් පිරිත් දේශනා කරන ලෙස ආරාධනා කිරීම සිරිතකි. එහිදී තිස් පැයක්,



තිස්පැ තුනක්, තිස් පැය පහක්, තිස්පැය හතක්, සතියක් ආදී වශයෙන් සඳහන් කර ආරාධනා කරයි. මෙම ආරාධනා වාක්‍යය මහා සංඝ රත්නය විසින් දායක පිංවතුන් ලවා ප්‍රකාශ කරවනු ලබයි.[3] සති පිරිතක හා තිස්පැය හතේ පිරිත් දේශනාවක නම් ආරාධනාව සිදු කිරීමෙන් අනතුරුව පිරිතේ තේවාව භාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ දායක පිරිසෙන් ප්‍රශ්න කීපයක් මෙහිදී විචාරණු ලබයි. එනම්,

1. මේ පිරිත අවසාන වන්නේ කවදාද?
2. සූත්‍ර දේශනාව පවත්වන්නේ කෙදින ද?
3. විහාරස්ථානය අයත් පළාත, දිස්ත්‍රික්කය, කෝරළය, පත්තුව කුමක් ද?
4. දොරකඩ අස්න ප්‍රකාශය සඳහා දරුවකු සූදානම් කර තිබේද? ආදී වශයෙන් ප්‍රශ්න අසා දොරකඩ අස්න ප්‍රකාශ කරන දරුවා මහා සංඝරත්නය වෙත දෙමාපියන් විසින් භාරදීම සිදු කරනු ලබයි. ආරාධනා කිරීමේ චාරිත්‍ර පිළිබඳව සැලකීමේදී තවත් එක් අවස්ථාවක් දක්නට ලැබේ. එනම් මහා සංඝරත්නය පිරිත් දේශනය කිරීමට මත්තෙන් විපත්ති පටිබාහාය---- ආදී වූ ගාථාත්‍රයක් දායකයන් ලවා ප්‍රකාශ කරමින් පිරිත් දේශනා කිරීමට ආරාධනා කිරීමයි සත් කෝරළය ප්‍රදේශයේදී මෙම චාරිත්‍රය සිදුකරන්නේ පන්සිල් සමාදන් කරවා දැහැත් වට්ටියක් පිළිගැන්වීමෙන් අනතුරුවය. අනෙක් ප්‍රදේශවලදී දැහැත් වට්ටිය පිළිගැන්වීම පන්සිල් ගැනීමට ප්‍රථමයෙන් සිදුකරනු ලබයි. "බණ පිරිත් පින්කම් කරවනු කැමැති දායක පක්ෂය කුළුපග වූ හෝ සමීප විහාරස්ථානයෙහි ආවාසික වූ හෝ පැවිදි කෙනෙකුන් ආධාර කොට ගෙන සංඝස්ථවිරයන් වසන වෙහෙරකට පැමිණ ආරාධනා කට යුතුයි.[4] යනුවෙන් බණ පිරිත් කතිකාවතෙහි ආරාධක වතෙහි ද මෙම ආරාධනා කිරීම

පිළිබඳව සඳහන්ව ඇත. සෙත් පිරිත්, වරු පිරිත් දේශනාවලදී ගාථාත්‍රයකින් ආරාධනා කිරීමේ සිරිත භාවිත නොවේ. මේ ආකාරයට පිරිත් දේශනාවකදී විශේෂිත වූ චාරිත්‍රයක් වශයෙන් ආරාධනා කිරීමේ සිරිත පවතින බව ඉහත කරුණු වලින් පැහැදිලිය.

## පිරිත් මණ්ඩපය

වරු පිරිතක් හැර තිස්පැයේ පිරිතේ සිට සති පිරිත දක්වා පවත්වන පිරිත් දේශනාවලදී පිරිත් මණ්ඩපයක් සකසනු ලබයි. මෙහි ආකෘති, අටපට්ටම් හෝ හතරැස් විය හැකිය. පුවක් පටි හෝ රීප්ප භාවිත කොට මණ්ඩපය සකසන අතර ගොක්කොළ හෝ කඩදාසි වලින් සරසනු ලබයි.[5] මණ්ඩපයේ උඩුවියන් බැඳ නූල් ඇද නාදළු, බුලත් කිණිති, පුවක් මල් එල්ලා විසිතුරු ආකාරයට සරසනු ලබයි. ධාතු කරඬුව, පිරිත් පැන් කළය, පිරිත් පොත සම්බන්ධවන පිරිදි පිරිත්හුය ගැටගැසිය යුතුය. පිරිත් මණ්ඩපයට බොහෝ ප්‍රදේශවල තබන්නේ එක් දොරටුවකි. එය බොහෝවිට නැගෙනහිරට මුහුණලා තැබීම සිරිතයි. නොඑසේ නම් දකුණු දෙසට මුහුණලා තබයි. එසේ කරන්නේ එම දිශාවන් සුභ දිශාවන් යැයි සැළකීමෙනි. දකුණු පළාතේ ඇතැම් පිරිත් මණ්ඩපයක දොරටු සතරක් තබයි. රාජගහ හෝ ඉන්ද්‍රඛීලය ඒ ඒ පළාත් අනුව නිකායික සම්ප්‍රදාය අනුව තැබීම හෝ නොතැබීම සිදුවේ. රජරට ප්‍රදේශය, දකුණු පළාත, සත් කෝරළය, සතර කෝරළය ගත්විට රාජගහක් හෝ ඉන්ද්‍රඛීලයක් භාවිත නොවේ. එහෙත් තිස්පැය හතේ හා සති පිරිත්වලදී එය සකස් කරනු ලබයි. මේ සඳහා බොහෝවිට භාවිත කරනු ලබන්නේ පුවක් පැලයකි. දකුණු පළාතේ මේ සඳහා අඩි හයක් පමණ රවුම් ලීයක් උපයෝගී කර ගනියි. මේ සඳහා සූරිය, ඉඹුල් වැනි වංශවත් කඳ පැලවෙන දැව විශේෂයක් භාවිත කිරීම ද සිදුවේ.[6] එසේ කරන්නේ පිරිත අවසන් වූ පසු එය පැලවීමට සිටුවීම සඳහාය. කාම් ආදී උවදුරු ඇති ඉඩමක සිටුවන අතර එයින් එම උවදුරු



දුරුවන බව ගැමි විශ්වාසයයි. එය ඉන්ද්‍රඛීල ලෙස හඳුන්වයි. රාජගහ හෙවත් ඉන්ද්‍රඛීල සුදු රෙද්දකින් අලංකාරවත් ලෙස සැරසීම ද සිදු කරයි.[7]

මණ්ඩපය තුළ අඩු තරමින් පුටු අටක් හෝ වැඩිම 16 ක් තැබීම ප්‍රමාණවත්ය. මණ්ඩපය මධ්‍යයේ මේසයක් තබන අතර ප්‍රධාන දොරටුවෙන් ඇතුලුවන විට වම්පස මුල්ලේ කරඬුව තැනපත් කිරීමට ආසනයක් තනනු ලබයි. දකුණු පළාතේ මෙසේ මණ්ඩපයට ඇතුලුවන විට වම්පස ආසනයක ධාතු කරඬුව තැන්පත් කිරීමට සකසන අතර බොහෝ ප්‍රදේශවලදී සධාතුක කරඬුව තැන්පත් කරන්නේ මණ්ඩපයේ මධ්‍යයේ ඇති මේසය මත උස්ව තැනූ ආසනයකය. පිරිත් මණ්ඩපය යන නම බොහෝ දෙනා භාවිත කරන අතර දකුණු පළාතේ මෙය පිරිත් කොටුව වශයෙන් හඳුන්වනු ලබයි. මණ්ඩපයට ඇතුලුවන දොරටුව දෙපස පුන්කලස් දෙකකි. දොරටු හතරක් යොදා ඇත්නම් පුන්කළස් අටක් තබයි. එම පුන්කළස් මල්වලින් සරසා එහි පහන් දල්වීම සිදුවේ. මේ ආකාරයෙන් පිරිත් දේශනා කිරීම සඳහා පිරිත් මණ්ඩපය හෙවත් පිරිත් කොටුව පැරණි චාරිත්‍රවලට අනුව විසිතුරු ලෙස සකස්කර ගනු ලබයි.

## තිස් පැයේ පිරිත

තිස්පැයක් යනු පුරා රාත්‍රියකි. සවස 6 සිට උදෑසන 6 දක්වා කාලය සිංහල ක්‍රමය අනුව තිස් පැයකි. එවන් කාල පරිච්ඡේදයක් පුරා පවත්වන පිරිත් තිස් පැයේ පිරිත වශයෙන් හඳුන්වයි. මේ සඳහා මූලික වශයෙන් ගෙහිමියා විසින් විහාරස්ථානයට ආරාධනා කොට සුදුසු දිනයක් වෙන්කර ගැනීම, ගේ දොර පිරිසිදු කොට, පිරිත් මණ්ඩපයක් සකස්කොට මූලික කරුණු සම්පූර්ණ කර ගත යුතුය. පිරිත් දේශනාව පවත්වන දිනයේ සිදුකරන ක්‍රියා පිළිවෙළ නම්,

- ආරාධිත විහාරස්ථානයට ගොස් බුද්ධ පූජාව පවත්වා දැහැත් ගිලන්පස පිළිගන්වා මහාසංඝරත්නය නියමිත වේලාවට සධාතුක කරඬුව හා පිරිත් පොත් වහන්සේ පෙරටු කොට පුද පෙරහැරින් වැඩමවීම. මේ සඳහා සුදු ඇඳගත් දෙදෙනෙකු සුදු ලේන්සු හෝ තුවා ඇතිව සිටිය යුතු අතර වියන ඇල්ලීමට හතර දෙනෙකු අවශ්‍යය.
- පා දෝවනය කොට සුදු පාවඩ මතින් මහා සංඝරත්නය නිවසට වැඩමවීම හා ගිලන්පස පිළිගැන්වීම.
- පිරිත් මණ්ඩපයට මහා සංඝරත්නය වැඩමවීම
- ගිහි පිරිස පන්සිල් සමාදන් කරවීම හා දැහැත් වට්ටියක් පිළිගන්වා පිරිතට ආරාධනා කිරීම සිදුකරයි. මෙම චාරිත්‍රය සත් කෝරළය, සතර කෝරළය ප්‍රදේශවල සිදුවන අතර අනෙක් ප්‍රදේශවල දැහැත් වට්ටිය පිළිගන්වා ආරාධනා කිරීම මූලිකවම සිදුකරයි.
- පිරිත් අනුශාසනාව, මෙහිදී පිරිතේ ඇති වටිනාකම හා ආනිශංස පිළිබඳ හැඳින්වීමක් සිදුකරනු ලබයි.
- පහන් දැල්වීම, මෙහිදී මණ්ඩපය වටා ඇති පුන්කලස් වල පහන් දැල්වීමත්, මණ්ඩපය ඉදිරිපිට මිදුලේ සැකසූ පහන් පැලෙහි පහන් දැල්වීමත් කෙරේ. එම පහන් පැළ සකසනු ලබන්නේ සතරවරම් දෙවියන් හා ගම්බාර දෙවියන් වෙනුවෙනි. පහන් 5 ක් දල්වා හඳුන්කූරු දල්වා, මල් පූජාකොට, ලදපස්මල් ඉස, හේවිසි වාදනය කරනු ලබයි.
- සියනෑ කෝරළය ප්‍රදේශයේදී, කොළඹ ප්‍රදේශයේදී පහන් දැල්වීමෙන් අනතුරුව පන්සිල් සමාදන් කරවීම, පිරිතට ආරාධනා ගාථා කියවීම සිදුකරනු ලබයි. එහෙත් දකුණු ප්‍රදේශය, සත් කොරළය, සතර කෝරළය, උඩරට ප්‍රදේශවල පන්සිල් සමාදන් කරවීම මුලින්ම සිදුවේ. රාමඤ්ඤ නිකායික හා අමරපුර නිකායික භික්ෂූන්



වහන්සේලා සෑම පළාතකදීම ප්‍රථමයෙන්ම පන්සිල් සමාදන් කරවා ගිලන්පස බුද්ධ පූජාව පැවැත්වීම සිදුකරයි.

- දේවතාරාධනාව.
- පිරිත් පේකිරීමෙන් පිරිත ආරම්භ කිරීම. මෙහිදී නමස්කාර පාඨය, තිසරණය වන්දනා කිරීම හා ජයමංගල ගාථා සජ්ඣායනය කොට යන්දුන්නිමිත්තං........, දුක්ඛපත්තා ච...... සබ්බේ බුද්ධා...... යනාදී වශයෙන් සජ්ඣායනා කරයි. සබ්බේ බුද්ධා......... ගාථා සජ්ඣායනය කරනවිට ධාතු කරඬුව, රාජගහ, පිරිත් පැන් කළය සම්බන්ධකර ඇති පිරිත්හුය, තද කිරීම සිදුකරණු ලබයි. දකුණු පළාතේ පිරිත් දේශනාවල පේ කිරීම සඳහා ඉහත දේශනා වලට අමතරව අවිජ්ජා පච්චයා... ආදී පාඨයන් භාවිතා කරයි. උඩරට ප්‍රදේශයේත්, රාමඤ්ඤ නිකායික භික්ෂූන් වහන්සේත් පිරිත් පේ කිරීම සිදු කරන්නේ නැත.
- මගුල් බෙර වාදන හා හේවිසි වාදන සිදු කිරීම තුන් විටක් සිදු කරයි. එහෙත් දකුණු පළාතේ මෙහිදී වාදනය කරන්නේ මගුල් බෙරය පමණයි.
- මහ පිරිත ආරම්භ කිරීම, මේ සඳහා තුන් සූත්‍රය හා මහා ජයමංගල ගාථා භාවිත කරයි. මණ්ඩපයේ වැඩ සිටින මහා සංඝරත්නය පිරිත් හුය අතට ගැනීමත්, ඊට සම්බන්ධව පිරිත් නූල් ගිහි පිරිස අතට ලබාදීමත් මෙහිදී සිදු කරනු ලබයි.
- යුග දේශනා පැවැත්වීම. පිරිත් පොතේ නමස්කාර පාඨයේ පටන් ඉසිගිලි සූත්‍රය අවසානය දක්වා.
- මධ්‍යම රාත්‍රිය ධම්මචක්කපවත්තන සූත්‍රය ඇතුළත් සූත්‍ර දේශනා හතක් දේශනා කිරීම.

- හතරදෙනා වහන්සේ නමක් බැගින් වැඩ හිඳගෙන ආටානාටිය සූත්‍ර දේශනාව, හමාර දේශනාව වශයෙන් දේශනා කිරීම.
- අලුයම සෙත් පිරිත් දේශනා පවත්වා පන්සිල් සමාදන් කරවා පිං අනුමෝදන් කිරීම
- පිරිත් පැන් පිරිත් නූල් ලබාදීම.[8]

## තිස් පැය තුනේ හා තිස්පැය පහේ පිරිත

මෙහිදී තිස්පැයේ පිරිතකට වඩා යම් යම් වෙනස්කම් දක්නට ලැබේ. මූලික චාරිත්‍ර ධර්ම තිස්පැයේ පිරිතක මෙන් සිදුවේ. තිස්පැය තුනේ පිරිතක් සඳහා රාත්‍රි කාල දෙකක් හා දවල් කාල එකක් යෙදේ. පළමු දින රාත්‍රී මහ පිරිත් දේශනාවෙන් අනතුරුව යුග දේශනා පැවැත්වීම සිදුවේ. පසුදින උදෑසන හයට මහාසංඝරත්නය මණ්ඩපයට වැඩමවා මහ පිරිත් දේශනාවක් පවත්වනු ලබයි. මහ පිරිතෙන් අනතුරුව නැවතත් යුග දේශනා පවත්වන අතර සවස 2.30 ට ජාම හේවිසි වාදනය පැවැත්වීමත්, 3.00 ට මහ පිරිත් දේශනාවත් සිදුවේ. සවස 5.00 ට පමණ තෙල්, මල්, රැගෙන පිරිත් පැන් කොතලයක් මණ්ඩපයෙන් ලබාගෙන පෙරහැරින් දේවාලයට ගොස් තෙල්මල් පුදා පිරිත් පැන් ඔප්පු කොට පිරිත් දේශනා කොට මඟුල් බෙර හේවිසි වාදනය පවත්වා දෙවියන්ට රාත්‍රී පිරිත් ඇසීමට පැමිණෙන ලෙස ආරාධනා කරනු ලබයි. දෙවැනි දින රාත්‍රී 10 ට මහ පිරිත් දේශනාව පැවැත්වීම සිදුවේ. මීට පෙර අවස්ථාවල පන්සිල් සමාදන් වීම මඟුල් බෙර හේවිසි පැවැත්වීම මහ පිරිතට පෙර සිදුවූවත් දෙවැනි දින එය සිදුවන්නේ සූත්‍ර දේශනා ආරම්භ වීමට පෙරය. ඊට හේතුව එදින විශේෂත්වයක් ගන්නේ ධම්මචක්ක සූත්‍රය ඇතුලු සූත්‍ර දේශනා පැවැත්වීම සඳහායි. ඊට මත්තෙන් ඉහත චාරිත්‍ර ඉටු කිරීම සිදුවේ. මහපිරිත් දේශනාවෙන් අනතුරුව සූත්‍ර දේශනා පිළිබඳ අනුශාසනාවක් පැවැත්වීමේ සිරිතක් සෑම පළාතකම පිරිත් දේශනාවලදී දක්නට ලැබේ. අනතුරුව මහා සංඝරත්නයටත්,



හේවිසි වාදන ශිල්පීන්ටත් පිරිත් පැන් ලබාදීම සිදුකර පන්සිල්හි පිහිටුවා මඟුල් බෙර හේවිසි වාදන කොට සූත්‍ර දේශනා ආරම්භ කරයි. ඉන් පසුව හමාර දේශනාවන් පවත්වා සෙත් පිරිත් දේශනා කොට පන්සිල් සමාදන් කරවා පිං අනුමෝදන් කර පිරිත් පැන්, පිරිත් නූල් බෙදාදීමෙන් නිමාවට පත්වේ. තිස් පැය පහේ පිරිත් දේශනාවේදී පිළියෙල මෙසේමය. එහිදී රාත්‍රී කාල තුනක් හා දවල් කාල දෙකක් පිරිත් දේශානව පැවැත්වේ.[9]

## තිස් පැය හතේ හා සති පිරිත

තිස්පැය හතේ හා සති පිරිත් සම්බන්ධ චාරිත්‍ර විධි රාශියකි. මෙම දෙකෙහි වෙනස වන්නේ කාලය වැඩිවීම පමණි. තිස්පැය හතේ පිරිත රාත්‍රී කාල 4 ක් දවල් කාල තුනකි. සති පිරිත දින හතකි. සමහරක් අවස්ථාවලදී දින 9 ක් යොදා ගනියි. මුල් දිනය හා අවසන් දිනය අතහැර දින හතක් යොදා ගනියි. සති පිරිත හා තිස්පැය හතේ පිරිත සම්බන්ධ චාරිත්‍ර විධි බොහෝ සෙයින් සෑම පළාතකම සමාන බවක් දක්නට පුළුවනි. එහෙත් දකුණු පළාතේ සුළු සුළු වෙනස්කම් දක්නට ලැබේ. තිස්පැය හතේ හා සති පිරිත සඳහා සහභාගි වන්නේ උපසම්පදා භික්ෂූන් වහන්සේලා පමණි. පළමු දින පිරිත පේ කිරීමෙන් අනතුරුව දොරකඩ අස්න ප්‍රකාශය සිදුවන තුරු සාමණේර හිමි නමකට හෝ ගිහි අයෙකුට මණ්ඩපයට ඇතුලුවිය නොහැක. මෙවන් පිරිත් දේශනාවක් සිදුකරන්නේ විහාරස්ථානයක හෝ වෙනත් පොදු ස්ථානයක පමණි. නිවෙස්වල සිදුවන්නේ නැත.[10]

මණ්ඩපය සකස් කිරීමේදී වෙනත් පිරිතකදී මෙන් නොව සුළු වෙනස්කම් දැකිය හැකිය. විශේෂයෙන් රාජගහ සහ ඊට සම්බන්ධ ප්‍රධාන ආසන දෙක හෙවත් යුගාසනය මණ්ඩපයේ මධ්‍යයට වෙන්නට සකස්කොට අනෙක් ආසන වටේට තබනු ලබයි. මහ පිරිත් දේශනා කරන විට යුගාසනයේ වැඩ හිඳින්නේ නැත. මහ පිරිත අවසන් වන විට දෙනමක් යුගාසනයට වැඩමවා යුග දේශනා ආරම්භ කරනු ලබයි. එහෙත් දකුණු පළාතේ මහ පිරිත

දේශනා කරන දෙනම යුගාසනයේ වැඩ හිඳිමින් දේශනා කරනු ලැබීම දක්නට ලැබේ.

අනෙක් පිරිත් දේශනා අවස්ථාවල මෙන්ම පළමුදින භික්ෂූන් වහන්සේ පිරිත් මණ්ඩපයට වැඩමවීම සිදුකරනු ලබයි. අනතරුව දැහැත් වට්ටියක් පිළිගන්වා සතියක් හෝ සත්වරුවක් පිරිත් දේශනා කරන ලෙස ආරාධනාව සිදුකරන අතර දොරකඩ අස්න ප්‍රකාශ කරන දේවදූත දරුවා හා පරිවාර දූතයන් මහා සංඝරත්නයට භාරදීමේ චාරිත්‍රය මෙහිදී සිදු කරයි. අනතුරුව පිරිත් දේශනාවේ තේවාව භාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ (උන්වහන්සේ පිරිතෙහි සියළු බලතල හිමි චාරිත්‍ර විධීන් සිදුකරනු ලබන ස්වාමීන්ද්‍රයන් වහන්සේය) තෙල්, මල්, ලඳපස් මල් මහා සංඝරත්නයට අත ගස්වා භික්ෂූන් වහන්සේ කීපනමක්, දායක පිංවතුන්, දේවදූත දරුවා හා පරිවාර දූතයන් සමග ත්‍රිවිධ චෛත්‍යය වන්දනා කොට පූජා හේවිසි පවත්වා දේවාලයට ගොස් පහන් දල්වා පිරිත් දේශනා කොට දෙවියන්ට පිං දී මඟුල් බෙර හේවිසි වාදනය කොට සති පිරිත් පිංකම පවත්වන බවත්, එහි යෙදී සිටින ගිහි පැවිදි සියල්ලන්ම ආරක්ෂා කරන ලෙසත්, පිරිත් ශ්‍රවණයට පැමිණෙන ලෙසත් ආරාධනා කරයි. ඉන්පසු සතරවරම් දෙවියන් හා ගම්බාර දෙවියන් වෙනුවෙන් ඉදිකළ පහන් පැළ දල්වා හේවිසි ශබ්ද පූජා පවත්වනු ලබයි.

අනතුරුව සිදුවන්නේ පිරිත් දේශනාව පිළිබඳ අනුශාසනාවයි. එහිදී විශේෂයෙන් මෙහි ඇති වටිනාකම මෙන්ම චාරිත්‍රවිධි පිළිබඳවද දැනුවත් කරන අතර සතියක් මුළුල්ලේ පවත්වන පිරිත් දේශනාවේ වැඩ පිළිවෙල පිළිබඳව ද දැනුවත් කරනු ලබයි. ඉන්පසු පිරිස පංචසීලයෙහි පිහිටුවීම සිදුකරයි. පිරිතට ආරාධනා ගාථා දේශනාව හා දේවතාරාධනාව තිස්පැය හතේ හා සති පිරිතේදී සිදු කරන්නේ පසුදා අළුයම් කාලයේය. පන්සිල් සමාදන් කරවීමෙන් අනතුරුව පිරිත් පේ කිරීම සිදුවේ. "අවිජ්ජා පච්චයා - අවිජ්ජායත්වේව - අනේක ජාති - ඉතිපිසෝ - ස්වාක්ඛාතෝ - සුපටිපන්නෝ - බාහුං සහස්ස - භවතු සබ්බ මංගලං - නක්ඛත්ත



යක්ඛ භූතානං යාව තතියා වාරං"[11] යනුවෙන් පිරිත් පේ කරන පිළිවෙල බණ පිරිත් කතිකාවතෙහි සඳහන් වේ. මෙම අවස්ථාවේ භවතු සබ්බ මංගලම් ගාථාව සජ්ඣායනා කරන විට දේව දූතයා විසින් මණ්ඩපය වටා ඇති කලස්වල පහන් දැල්විය යුතුය. දකුණු පළාතේ පිරිත් පේ කිරීමේදී තුනුරුවන් වන්දනා කර අවසන් වන තෙක් මහා සංඝරත්නය වැඳගෙන පිරිත් දේශනා කරයි. අනෙක් ප්‍රදේශවල මහා සංඝරත්නය තල් අත්ත අතට නොගෙන පිරිත් දේශනා කරයි. පිරිත් පේ කිරීමෙන් පසුව මඟුල් බෙර වාදනය හා හේවිසි ශබ්ද පූජා පවත්වා මහා සංඝරත්නය පිරිත් හුය අතට ගෙන මහ පිරිත දේශනා කරනු ලබයි. සබ්බේ බුද්ධා බලප්පත්තා ගාථාව දේශනා කරන විට මහා සංඝරත්නය අත ඇති පිරිත් හුය මණ්ඩපයේ උඩ ගැට ගැසීම කරයි. "පරිත්තං භණන්ති - කරණීය මෙත්ත - සුත්තං - යං කිඤ්චි චිත්තං - යාව ඛීණං පුරාණං - යන්දුන්නිමිත්තං - දුක්ඛප්පත්තා ච - සබ්බේ බුද්ධා... යනාදි වශයෙන් මහ පිරිත දේශනා කරන පිළිවෙල බණ පිරිත් කතිකාවතෙහි දක්වේ.[12]

තිස්පැය හතේ පිරිත් දේශනාවකදී නම් මහ පිරිත් දේශනය අවසන් වනවිට දෙනමක් යුගාසනයට වැඩමවා දේවදූතයා ලවා පිරිතට ආරාධනා ගාථා කියවා දේවාරාධනය කොට යුග දේශනා ආරම්භ කරයි. සති පිරිත් දේශනාවකදී මහ පිරිත් දේශනාවෙන් පසුව මහා සංඝරත්නය තුණුරුවන් වන්දනා කොට මණ්ඩපය වසා තබනු ලබයි. නැවත පිරිත ආරම්භ කරන්නේ අළුයම් කාලයේය. එහෙත් දකුණු පළාතේදී ආරාධනා ගාථා කියවා දේවාරාධනා කොට දස ධම්ම සූත්‍රය අවසානය දක්වා යුග දේශනා පවත්වා නැවතත් තුන් සූත්‍ර හා මහ ජයමංගල ගාථා මුල්කොට කඩිනමින් මහ පිරිතක් දේශනා කොට මංගල සූත්‍රයේ සිට යුග දේශනා ආරම්භ කරනු ලබයි.

දිනපතා උදේ හයට, සවස තුනට හා රාත්‍රී නවයට මහ පිරිත් දේශනාවන් පවත්වන අතර අන් අවස්ථාවල යුග දේශනා නොකඩවා පැවැත්වේ. ඒ සඳහා නමස්කාර පාඨයේ පටන්

ඉසිගිලි සූත්‍ර අවසාන දක්වා භාවිත කරයි. ඉසිගිලි සූත්‍රයේ අවසාන ගාථා දෙක දේශනා කරන්නේ නැත . එය දේශනා කරනු ලබන්නේ අවසන් දිනයේ මංගල සූත්‍ර දේශනාවට ප්‍රථමයෙනි. එසේ කිරීමට හේතුව පිරිත් පොතෙහි සම්බන්ධතාවය ආරක්‍ෂා කිරීම සඳහාය.

තිස්පැය හතේ පිරිතක නම් තුන්වන දිනය හා සති පිරිතක නම් හයවන දින තවත් වැදගත් දිනයකි. මෙම දිනය හඳුන්වන්නේ සූත්‍ර දේශනා දිනය වශයෙනි. එදින සවස මහ පිරිත් දේශනාවෙන් පසුව මණ්ඩපය හා මල්පැල්, පුන්කලස් අලුත් කිරීම සිදුවේ. නා දළු, බුලත් කිනිති, පුවක් මල් කිනිති අළුතින් මණ්ඩපයෙහි එල්ලනු ලබයි, පිරිත් හුය නැවත ගැට ගැසීමට ගොක් කොළ වට්ටේට දැමීම ද සිදුවේ, මණ්ඩපය වටා ඇති පුන්කලස්වලට අලුතින් පොල්මල් දමා සකසන අතර එළියේ පහන් පැළ නැවත සකස් කරනු ලබයි, ඊට හේතුව එදින සූත්‍ර දේශනා පැවැත්වීමත් දෙවියන්ගේ පැමිණීම සිදුවීමත්ය. එදින මහ පිරිත් දේශනාව පවත්වන්නේ රාත්‍රී 10 ටයි, එසේම සවස් කාලයේ තෙල් මල් පිරිත් පැන් දේවාලයට වැඩමවා දෙවියන්ට ආරාධනා කිරීමේ චාරිත්‍රයක් ද සිදුකෙරේ. රාත්‍රී මහ පිරිත් දේශනාව පවත්වා සූත්‍ර දේශනා පිළිබඳ විශේෂ අනුශාසනාවක් සිදුකරයි. ඉන් පසුව මහා සංඝරත්නයට හා හේවිසි වාදන ශිල්පීන්ට පිරිත් පැන් ලබාදී අනුශාසනා දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේට හා දේවදූත දරුවාට භවතු සබ්බ මංගලං...... ගාථාව කියා පිරිත් පැන් ලබා දීමේ චාරිත්‍රයක් සිදුවේ. අනතුරුව පන්සිල් සමාදන් කරවා මගුල් බෙර හේවිසි වාදනය කොට දම්සක් පැවතුම් සූත්‍රය ඇතුළු සූත්‍ර හතක් අළුයම දක්වා දේශනා කරනු ලබයි. අළුයම කාලයේ නැවතත් යුග දේශනා ආරම්භවන අතර එදිනට උදේ හයට දේශනා කරන මහ පිරිත දේශනා කරන්නේ නැත. දකුණු පළාතේ නම් මහ පිරිතට පෙර මගුල් බෙර වාදනය සූත්‍ර දේශනා දිනයේත් සිදුකරනු ලබයි. එහිදී මගුල් බෙරය පමණක් වාදනය කිරීම දක්නට ලැබේ.[13]



තිස්පැය හතේ හා සති පිරිත් දේශනාවල අවසාන දිනය විශේෂ චාරිත්‍රවලින් සමන්විතය. පෙරදින සූත්‍ර දේශනා අවසන් කොට නැවත යුග දේශනා ආරම්භ වේ. අනෙක් දිනවල උදේ 6 ට මහපිරිත් දේශනාවක් පැවැත්වූ අතර අවසන් දින එම මහපිරිත් දේශනාව පවත්වන්නේ උදේ 9 ටයි. තිස්පැය හතේ හා සති පිරිත් දේශනාවල අවසාන දිනය දොරකඩඅස්න හා අනුශාසනා අස්න පවත්වන දිනය වශයෙන් හැඳින්වේ. මෙදිනට දේවාල තල්පත් සකස් කිරීම සඳහා තල ගොබයක් අවශ්‍ය වේ. තල ගොබය කපාගන්නා තල ගස පෙර දිනයේදී පේ කිරීම සිදු කළ යුතුය. තල ගස වටා හොඳින් ශුද්ධ පවිත්‍ර කොට පහන් පැලක් සකස් කොට ගස වටා ගොක් රැහැන් ඇදීම මූලිකව කළ යුතුය. එම ස්ථානයට මහා සංඝරත්නය වැඩමවා පහන් දල්වා පිරිත් දේශනා කොට මගුල් බෙර හේවිසි වාදනය කොට තල ගස පේ කිරීම සිදුකෙරේ. එසේ සිදු කරන්නේ පසු දින දේවාල තල්පත් සකස් කිරීමට අවශ්‍ය තල්පත් සඳහා තල ගොබය පිරිසිදු ලෙස ලබා ගැනීම සඳහාය.

අවසන් දින විශේෂ චාරිත්‍ර රැසක් සිදු වේ. මහා සංඝරත්නය උදේ 9 ට මණ්ඩපයට වැඩමවා මහපිරිත දේශනා කරණු ලබයි. අනතුරුව අනුශාසනාව දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේ, දේවාල පත්‍රය භාර ස්වාමීන් වහන්සේ, දේවදූත දරුවා, පරිවාර දූතයන් හා තල ගොබය මණ්ඩපයට වැඩමවීම සිදු වේ. පළමුව තේවාව භාර ස්වාමීන් වහන්සේ තල ගෙබය භාර ගෙන එයින් එක් තල් පතක් ගෙන දේවාල පත්‍රය භාර ස්වාමීන් වහන්සේ වෙත භාර දීම සිදුවන අතර උන්වහන්සේ නැකත එහි සටහන් කරනු ලබයි. නැකත සටහන් කළ තල් පතට පිරිත් පැන් ඉස සුවඳ දුම් අල්ලා වතාවත් සිදු කිරීම තේවාව භාර ස්වාමීන් වහන්සේ විසින් සිදු කරයි. මෙසේ නැකත සකස් කිරීමේ අදහස වන්නේ විහාර අස්න දේශනා කිරීමට සුදුසු වේලාව යන්නයි. මෙය ලිත දේශනා කිරිම, නැකත දේශනා කිරීම වශයෙන් ද භාවිතා කරයි. ලිත දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේටත්,

අනුශාසනාව දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේටත්, දේවදූත දරුවාටත් පිරිත් පැන් ලබා දී පිරිස පන්සිල්හි පිහිටුවා ලිත දේශනා කරණු ලබයි. එය දේවාල පත්‍ර භාර ස්වාමීන් වහන්සේ විසින් සිදු කරනු ලබයි. ලිත දේශනාවෙන් අනතුරුව අනුශාසනා දේශනා කරන ස්වාමීන් වහන්සේ යුග පුටුව පිටුපස සිටගෙන විහාර අස්න දේශනාව කරනු ලබයි. එහි අන්තර්ගත වන්නේ ලංකාවේ පැරණි සිද්ධස්ථාන 275 ක නාමාවලියකි. එම නාමාවලිය නම් පොතෙහි ඇතුලත් වී ඇත.[14]

ඉහත දේශනාවෙන් පසුව නැවත පිරිත් දේශනා නොකරන අතර, නැවත පිරිත් දේශනාව ආරම්භ වන්නේ සවස දේවදූත පෙරහැර විහාරස්ථානයෙන් පිටව ගිය පසුවයි. මේ අතර කාළය තුළ තවත් විශේෂ චාරිත්‍රයක් ඉටු කරනු ලබයි. එනම් දේවාල තල්පත් සකස් කිරීමයි. දේවාල තල්පත් පහක් සකස් කෙරේ. මෙය දේවාල පත්‍රය භාර ස්වාමීන් වහන්සේ විසින් සකස් කරනු ලබන අතර එහි අන්තරගත වන්නේ අසවල් විහාරස්ථානයේ පිරිත් දේශනා පිංකමක් පවත්වන බවත්, බණ සමහර කරන තැනට සහපිරිවර දෙවියන් සමග පැමිණෙන ලෙස කරන සංඝ ආඥාවකි. පිරිත් පිංකම සිදු කරන විහාරස්ථානයට ආසන්න විහාරස්ථානයක දේවාලයකට හෝ ආසන්න විශේෂ දේවාලයකට මෙම තල් පත් වැඩම කරවා ඔප්පු කිරීම එහිදී සිදු වේ.[15]

සවස 3.00 ට පමණ මහා සංඝරත්නය මණ්ඩපයට වැඩමවීමත්, අනතුරුව අනුශාසනා දේශනාව පවත්වන ස්වාමීන්ද්‍රයන් වහන්සේත්, අලංකාර ඇඳුම්වලින් සැරසුණු දේවදූතය හා පරිවාර දූතයන් මණඩපයට වැඩමවීම සිදු වේ. පෙරහැරෙහි වැඩමවන මහා සංඝරත්නයටත්, අනුශාශනා දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේටත්, හේවිසි කරුවන්ටත් පිරිත්පැන් දීම මූලිකව සිදු වේ. දේවදූතයා ඇතුලු පිරිස පන්සිල්හි පිහිටුවා දේවාල පත්‍රය දේශනා කිරීම සිදුවන අතර එයින් අදහස් කරන්නේ දෙවියන් වෙත මහා සංඝරත්නය විසින් සිදු කරන



සංඝ ආඥාවකි. පිරිත් පිංකම සිදු කරන විහාරස්ථානයේ නම සඳහන් කර එහි පිරිත් දේශනා පිංකමක් සිදුවන බවත්, පිං අනුමෝදන් වීම සඳහා සහපිරිවරින් පැමිණෙන ලෙසත් සංඝ ආඥා කොට ආසන්න විහාරස්ථානයක, දේවාලස්ථානයකට හෝ විශේෂ දේවාලයකට ගොස් මල් පහන් පුදා වතාවත් සිදුකොට ඉදිරිපත් කරනු ලබයි. මල්වට්ටි පහක්, පිරිත් පැන් කොතළයක්, පොල්තෙල් බෝතලයක්, හඳුන්කූරු, කපුරු දේවාලය වෙත රැගෙන යා යුතුයි. පූජා ද්‍රව්‍යයන් දේවාලයට ඔප්පු කර එම දේවාලස්ථානයේදී ද දේවාල තල්පත දේශනා කොට මගුල් බෙර හෙවිසි වාදනය කළ යුතුය. දකුණු පළාතේ දේවාලයේදී තල්පත දෙවදූත දරුවා විසින් කියවනු ලබයි. එසේම දකුණු පළාතේ දේවදූතයා සමග පරිවාර දූතයන් අට දෙනෙකු යොදා ගනියි.

දේවාල පෙරහැර විහාරස්ථානයෙන් පිටත් වූ පසු මහා සංඝරත්නය නමස්කාර පාඨයේ පටන් දසධම්ම සූත්‍රය අවසානය දක්වා යුග දේශනා කොට මහපිරිත් දේශනාවක් සිදුකර නැවතත් යුග දේශනා ආරම්භ කරයි. එම යුග දේශනාවන් රාත්‍රී මංගල සූත්‍ර දේශනාව දක්වා සිදු කෙරේ. විශේෂයෙන් දකුණු පළාතේ දේවදූත පෙරහැර විහාරස්ථානයට ගෙවදින අවස්ථාවේ මහාසමය සූත්‍ර දේශනාව පවත්වනු ලබයි. ඊට හේතුව මහාසමය සූත්‍රය ඇසීමට දෙවියන් ප්‍රිය කිරීමයි. එහි ඇතුලත් වන්නේ දෙවියන්ගේ නම්ගොත් වීම ඊට හේතුවයි. මෙය ඉතා විසිතුරු ලෙස කරන දේශනාවකි.[16]

### හේමකද

තිස්පැය හතේ හා සති පිරිත් දේශනාවල හේමකද භාවිත කිරීමද විශේෂ චාරිත්‍රයකි. හේමකද යන්නෙන් දෙවියන් සඳහා ගෙනයන කද ලෙස හැඳින්වේ.[17] හේමකද සකස් කිරීම ඉතා දක්ෂ යතිවරයෙකුගේ අනුශාසනා පරිදි මහා සංඝයා විසින් කරනු ලැබේ. කතරගම දේවාලයේ මුරුතැන් කද, දළද මාලිගාවේ බුද්ධ පූජාව වැඩමවන කද ආදර්ශ කොට හේම කද සකස් කරති.[18]

දේවදූතයා විසින් දේව තල්පත් රැගෙන යන්නේ හේම කදෙනි. දේව තල් පත් දෙකට නවා සුදු රෙද්දකින් ඔතා මෙය සකස් කර ගැනීම සාමාන්‍ය පිළිවෙතයි. දකුණු පළාතේ මේ සඳහා අලංකාර හේමකදක් සකස් කරනු ලබයි. පොල් පිත්තේ පට්ටාවලින් සකසන ලද කේතුවක හැඩය ගත් බඳුන් දෙකක් සකස් කොට අඩි තුනක පමණ පොල් නාරටියක දෙපස ගැටගසා අලංකාර රෙදිවලින් සරසනු ලබයි. එහි එක් පසෙක දේව තල්පත් හා අනෙක්පස බුලත් කිණිති, නා කිණිති හා පුවක් මල් කිණිති එල්ලනු ලබයි. අනෙක් බොහෝ ප්‍රදේශවල බුලත් කිණිති, නා කිණිති හා පුවක්මල් කිණිති දේව තල්පතෙහිම මුල් කොනෙහි එල්ලනු ලබයි. මෙසේ අලංකාරයෙන් සකසාගත් කද හේමකද වශයෙන් ව්‍යවහාර කරයි. මෙසේ සකස්කළ හේමකද දේවදූතයා විසින් පෙරහැරෙහි රැගෙන යයි. දකුණු පළාතේ හේමකද රැගෙන දේවදූතයා හා පරිවාර දූතයන් මණ්ඩපය වටා තුන් විටක් පැදකුණු කොට පෙරහැරට එකතුවෙයි. අනෙක් ප්‍රදේශවලදී සිදුවන්නේ ප්‍රධාන දොරටුව අභියසදී අනුශාසනා දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙතින් හේමකද ලබා ගෙන පෙරහැරට එකතු වීමයි.

### දොරකඩ අස්න හා අනුශාසනා අස්න දේශනාව

සති පිරිත් හා තිස්පැය හතේ පිරිත් දේශනාවල අවසාන දින රාත්‍රිය විශේෂිත චාරිත්‍ර විධි අනුගමනය කරනු ලබයි. එදින විශේෂත්වය වන්නේ දොරකඩ අස්න ප්‍රකාශය හා අනුශාසනා අස්න දේශනාවයි. රාත්‍රී දහයට පමණ මහා සංඝරත්නය මණ්ඩපයට වැඩමවීම සිදු වේ. මණ්ඩපයට වැඩමකළ භික්ෂූන් වහන්සේ පළමුව එතෙක් දේශනා නොකළ ඉසිගිලි සූත්‍රයේ අවසාන ගාථා දෙක දේශනා කිරීම සිදු කරයි. මෙහිදී එම දේශනාව කිරීමට හේතුව පිරිත් පොතේ මුල් බණවර දෙක හා තුන්වන බණවර සම්බන්ධ කිරීමයි. ඉන්පසු මංගල සූත්‍රය දේශනා කෙරේ. එදිනට මංගල සූත්‍රය පමණක් දේශනා කිරීමට බලපෑ



හේතු දෙකකි.

- පිරිත ආරම්භක දිනයේ මහපිරිත් දේශනාවට රතන සූත්‍රය හා කරණීයමෙත්ත සූත්‍රය පමණක් දේශනා කරන ලදි. එදින දේශනා නොකළ මංගල සූත්‍රය අවසන් දින රාත්‍රියේ දේශනා කිරීම.
- අවසන් දින රාත්‍රියේ පිරිත් ශ්‍රවණයට දෙවියන් පැමිණෙන බැවින්, දෙවියන්ට ඇතිවූ පැනයක් විසඳීමට බුදුරජාණන් වහන්සේ දේශනා කළ මංගල සූත්‍රය ශ්‍රවණයට දෙවියන් ප්‍රිය කිරීම.

මංගල සූත්‍ර දේශනාවෙන් පසුව අනුශාසනා දේශනාව සිදු කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා දේවදූත දරුවාත් පරිවාර දූත දරුවනුත් මණ්ඩපයට වැඩමවීම සිදු වේ. එහිදී පළමුව සිදු කරන්නේ දොරකඩ අස්න හා අනුශාසනා අස්න පිළිබඳව හැඳින්වීමක් ඇතුලත් අනුශාසනාවක් කිරීමයි. දේවදූත දරුවා හා පරිවාර දූත දරුවන් ඇතුලු ගිහි පිරිස පංචසීලයෙහි පිහිටුවා අනුශාසනා අස්න දේශනා කරන ස්වාමීන්ද්‍රයන් වහන්සේටත්, දේවදූත දරුවාටත්, පරිවාරදූත දරුවන්ටත් පිරිත් පැන් දෙනු ලබයි. ඉන්පසුව අනුශාසනා දේශනාව ආරම්භ කෙරේ. පළමුව මණ්ඩපද්වාරයෙහි මිනිස්සු ඇත්දැයි ප්‍රශ්න කරන අතර දරුවා මිනිස්සු ඇතිබව පිළිතුරු දෙයි. දෙවනුව දේවතාරාධනාවට ගියාදැයි විමසයි. පුද පෙරහැරින් දේවතාරාධනාවට ගිය බව දේව දූත දරුවා සඳහන් කරයි. තුන්වෙනුව විමසන්නේ දෙවියන් ගේ පැමිණීම පිළිබඳවයි. සතරවරම් දෙවිවරුන් ප්‍රධාන සෑම දෙවියන්ම පැමිණ ඇති බව පිළිතුරු දෙනු ලබයි. ධෘතරාෂ්ඨ, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවන යන සතරවරම් දෙවි මහ රජ දරුවන් අතුලු සෑම දෙවියෝම සහ පිරිවරින් වැඩිසේක[19] යනුවෙන් සඳහන් වේ. දොරකඩඅස්න ප්‍රකාශනයෙන් අනතුරුව සිදුවන්නේ අනුශාසනා අස්න දේශනාවයි. මෙයින් සිදු කරන්නේ පිංකම සිදුකිරීමෙන් ලැබූ පිං දෙවියන්ගේ නම් ගොත් ප්‍රකාශ

කරමින් අනුමෝදන් කරවීමයි. පිං අනුමෝදන් වූ දෙවියන්ගේ ආශීර්වාදය පිංකම කරවූ අයට සලසා දීමයි.

## පිරිත හමාර කිරීම

දොරකඩ අස්න හා අනුශාසනා අස්න දේශනාව අවසන් වීමෙන් අනතුරුව හතර දෙනා වහන්සේ බැගින් වැඩහිඳ ආටානාටිය සූත්‍ර දේශනාව පවත්වනු ලබයි. මෙය හමාර දේශනාව නමින් ද හැඳින්වේ. ඊට ඇතුලත් වන්නේ පිරිත් පොතෙහි තුන්වන හා හතරවන බණවර දෙකයි. හමාර දේශනාවෙන් පසුව සෙත් පිරිත් දේශනාව පවත්වා, පන්සිල් සමාදන් කරවා පිං අනුමෝදන් කොට පිරිත් පැන් හා පිරිත් නූල් ලබා දීමෙන් පිරිත හමාර වේ.

## ශබ්ද පූජා පැවැත්වීම හා සම්බන්ධ චාරිත්‍ර

පිරිත් දේශනාවලදී ශබ්ද පූජා පැවැත්වීම අවස්ථා කීපයකදී සිදු වේ. එනම්,

- සධාතුක කරඬුව, පිරිත් පොත් වහන්සේ හා මහා සංඝරත්නය මණ්ඩපයට වැඩම කරවීමේ අවස්ථාව
- පහන් පැල් දල්වන අවස්ථාවේ දෙවියන් වෙනුවෙන් ශබ්ද පූජා පැවැත්වීම.
- මහපිරිත් දේශනාවට පෙර මගුල්බෙර හා හේවිසි ශබ්ද පූජා පැවැත්වීම. මෙය තුන් විටක් පවත්වනු ලබන අතර දකුණු පළාතේ මගුල් බෙරය පමණක් වාදනය කරයි. හත් කෝරළය ප්‍රදේශයේදී හත්වාරයක් මගුල් බෙර හා හේවිසි ශබ්ද පූජාව පැවැත්වේ.
- ධම්මචක්කසූත්‍ර දේශනාව ආරම්භ වීමට ප්‍රථමයෙනුත්, මහාසමය සූත්‍ර දේශනාව ආරම්භවීමට ප්‍රථමයෙනුත් නැවත ශබ්ද පූජා පවත්වනු ලබයි. තිස්පැය හතේ හා සති පිරිත් දේශනාවලදී ධම්මචක්ක සූත්‍රය ඇතුලු සූත්‍ර හතම දේශනා කිරීමේදී එක් එක් සූත්‍රයක් ආරම්භ වීමට ප්‍රථම ශබ්ද පූජා පවත්වනු ලබයි.
- ආටානාටිය සූත්‍ර දේශනාව ආරම්භ වීමට ප්‍රථමයෙන් ද ශබ්ද පූජා පැවැත්වේ.
- පිරිත් දේශනාව අවසාන වීමේදී ද මගුල් බෙර හේවිසි පැවැත්වීම සිදුවේ.
- තිස්පැයට වැඩි පිරිත් දේශනා අවස්ථාවල මහපිරිතට වැඩමවන අවස්ථා හේවිසි ශබ්ද පූජා මැද සිදුවේ.
- තිස්පැය තුන, තිස්පැය පහ, තිස්පැය හත හා සති පිරිත් දේශනාවලදී උදේ 5.30 ට පමණ අලියන්දුරේ තේවාව ද, සවස 2.30 ට ජාම හේවිසි පැවැත්වීම ද, සවස 6.00 ට හැන්දෑදුරේ තේවාව ද සිදු කිරීම විශේෂත්වයක් ගනියි. එසේම උදේ, දවල්, හවස බුද්ධ පූජාවන් පවත්වන අවසථාවලද ශබ්ද පූජා පැවැත්වේ.



## ආන්තික සටහන්

1. 2015 නොවැම්බර් 10 දින දඹදෙණිය රජමහා විහාරයේදී දාහිගමුවේ සුමංගල හිමියන් සමග පවත්වන ලද සාකච්ඡාව ඇසුරිණි.
2. ප්‍රඥාසාර නායක ස්ථවිර, කිරිවත්තුඩුවේ (සංස්), 1954 පාළි සිංහල පිරිත්පොත, විද්‍යාලංකාර මුද්‍රණාලය, කැලණිය, පිටුව 12.
3. චන්දිම හිමි, බෝදාගම (සංස්), 2006, පිරුවානා පොත් වහන්සේ, ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම, වීදාගම, පිටුව 386.
4. ප්‍රනාන්දු, සොම්පාල, (සංස්) බු.ව 2547 නිවන්මග, පරිත්‍රාණ දේශනා, තිස්හත්වන කලාපය, රජයේ මුද්‍රණාලය, බෞද්ධ සංගමය, කොළඹ, පිටුව 11.
5. චන්දිම හිමි, බෝදාගම (සංස්), 2006, - එම -, පිටුව 371.

6. ඉන්දරතන හිමි, අතුරලියේ, 1984, ශාසනික පරිත්‍රාණ විධිය, පොල්හේනේ පුරාණ මහා විහාරස්ථ දායක සභාව, මාතර, පිටු, 45, 46

7. ඉන්දරතන හිමි, අතුරලියේ, 1984, -එම-, පිටුව,47.

8. ඉන්දරතන හිමි, අතුරලියේ, 1984, -එම-, පිටුව, 48.

9. ඉන්දරතන හිමි, අතුරලියේ, 1984, -එම-, පිටු, 59, 60, 61.

10. 2015 ඔක්තෝම්බර් 20 දින තෙබුවන සුභූති හිමියන් සමග සිදුකළ සාකච්ඡාව ඇසුරිණි.

11. චන්දිම හිමි, බෝදාගම, (සංස්), 2006, - එම -, පිටුව 379.

12. චන්දිම හිමි, බෝදාගම, (සංස්), 2006, - එම -, පිටුව 379.

13. කැළණි රජමහ විහාරයේ වාර්ෂික සති පිරිත් දෙශනාවන්හිදී නිරීක්‍ෂණයෙන් ලබා ගත් තොරතුරු

14. ප්‍රඥාසාර නායක ස්ථවිර, කිරිවත්තුඩුවේ (සංස්), 2002, පාළි සිංහල පිරිත් පොත, ගොඩගේ සහෝදරයෝ, කොළඹ 10, පිටුව, 409.

15. ඉන්දරතන හිමි, අතුරලියේ, 1984, -එම-, පිටුව, 289.

16. ඉන්දරතන හිමි, අතුරලියේ, 1984, -එම-, පිටුව, 63

17. ගමගේ, ගැමුණු සිරි, 2009, පිරිතෙහි පරිණාමය, නැණිල පබ්ලිකේෂන්, නුගේගොඩ, පිටුව, 295.

18. ඉන්දරතන හිමි, අතුරලියේ, 1984, -එම-, පිටුව, 268.

19. ප්‍රඥාසාර නායක ස්ථවිර, කිරිවත්තුඩුවේ (සංස්), 2002, පාළි සිංහල පිරිත් පොත, ගොඩගේ සහෝදරයෝ, කොළඹ 10, පිටුව, 361